# ක්‍රිස්තෝත්පත්ති මංගල මහෝත්සවය
# දිවා කාලයේ දිව්‍ය පූජා මෙහෙය

## පළමුවන දේව ප්‍රකාශනය — යෙසායා 52: 7–10

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

අපේ දෙවිඳාණන්ගේ ගැළැවීම, ලොවේ සීමාන්තයෝ දකිති.

සුබ ආරංචි ගෙන එන, සාමය ප්‍රකාශ කරන, යහපත ගැන සුබසුන් පළ කරන ගැළවීම ගැන ලොවට දන්වන, "නුඹේ දෙවිතුමාණෝ රජකම් කරන සේක" යි සියොනට කියන, කඳු මුදුන්හි පෙනෙන දූතයාගේ පාද කොපමණ අලංකාර වන්නේ ද? නගරය මුර කරන්නන්, හඬ නගා එක් ව ගී කියනු ඇත. සියොනට සමිඳාණන් වඩින බව ඔවුන් සියැසින් දකිනු ඇත. ජෙරුසලෙමේ නටබුන්, එක් ව ගී ගයන්න: ඝෝෂා කරමින් හඬ නගන්න. සමිඳාණෝ සිය සෙනඟ සැනසූ සේක. සමිඳාණෝ ජාතීන් ඉදිරියේ සියොනට ශුද්ධ බලය පෑ සේක. අපේ දෙවිඳුන්ගේ ගැළැවීම ලොවේ සීමාන්තයෝ දකිති.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 98: 1–6

පිළිතුර: මිහිපිට සියළු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝය.

ගීය : සමිඳුන්ට නව ගීයක් ගයන්න:
මන්ද, එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක.
සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක.
සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක:
විජාතීන්ගේ ඇස් හමුයෙහි සිය විමුක්ති බලය එළිදරව් කළ සේක.

එතුමාණෝ ඉශ්රායෙල් වංශය කෙරෙහි එතුමන්ගේ ප්‍රේමයත්,
විශ්වාසවන්තකමත් සිහි කළ සේක.
මිහිපිට සියළු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝ ය.
එම්බා ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්න:
ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

වීණාව වයමින් සමිඳුන්ට ගී ගයන්න:
වීණාවෙන් ද ගී නාදයෙන් ද ප්‍රශංසා කරන්න.
හොරණෑ හා තළා හඬින් ද රජාණන් වන
සමිඳුන් අබිමුව ප්‍රීතියෙන් ගී ගයන්න.
ප්‍රීති ගී ගයමින් එතුමාණන් පසසන්න.

## දෙවන දේව ප්‍රකාශනය — හෙබ්‍රෙව් 1: 1–6

*හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

**දෙවි සමිඳාණෝ ස්වකීය පුත්‍රයාණන් මගින් අපට කතා කළ සේක.**

දෙවියන් වහන්සේ ආදි යුගවල දී නොයෙක් විට ද විවිධාකාරයෙන් ද, දිවැසිවරයන් මගින් අපේ පියවරුන්ට කතා කළ සේක. එහෙත් දැන් මේ අවසාන කාලයේ දී උන් වහන්සේ සිය පුත්‍රයාණන් මගින් අපට කතා කළ සේක. උන් වහන්සේ කරණකොට ගෙන දෙවියන් වහන්සේ මුළු විශ්වය මවා, සියල්ලේ උරුමක්කාරයාණන් කොට උන් වහන්සේ පත් කළ සේක. උන් වහන්සේ දෙවියන් වහන්සේගේ මහිමතාවයේ ප්‍රභාවය ද දේවත්වයේ ස්වරූපය ද වන සේක්, තමන්ගේ ප්‍රබල වචනයෙන් සියල්ල දරන සේක. පාප ශෝධනය ඉටු කළ පසු, උන් වහන්සේ උත්තම ස්ථානයෙහි මහෝත්තමයාණන්ගේ දකුණත අසුන් ගත් සේක.

මෙසේ දේව දූතයන්ට වඩා ශ්‍රේෂ්ඨ නාමයක් පුත්‍රයාණන් වහන්සේට උරුම වූ බැවින් උන් වහන්සේ ඔවුන්ට වඩා බොහෝ සේ උතුම් වන සේක. මන්ද: “ඔබ මාගේ පුත්‍රයා ය: මම අද ඔබ ජනිත කෙළෙමි”යි කියාත්, “මම ඔහුට පියෙක්

වන්නෙමි, ඔහු මට පුත්‍රයෙක් වන්නේය" කියාත් උන් වහන්සේ දේව දූතයන්ගෙන් කවරෙකුට කවදාවත් නොවදාළ සේක. උන් වහන්සේ තමන්ගේ කුළුඳුල් පුත්‍රයාණන් ලෝකයට නැවත එවන කල: "දෙවියන් වහන්සේගේ සියලු දූතයෝ උන් වහන්සේට නමස්කාර කරත්වා"යි වදාරණ සේක.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
පූජනීය දිනයක් අප මත උදා විය.
ජාතීන් සියල්ලෙනි, අවුත් සමිඳුන් නමදින්න.
මන්ද, අද දින මිහිතලය මත මහා ආලෝකයක් බැබළෙන්නේය.
ආලේලූයා!

## සුවිශේෂය ජොහන් 1: 1-18 හෝ 1-5, 9-14

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වැඩ විසූ සේක.

ආරම්භයේ දී, ධර්මයාණෝ සිටි සේක: ධර්මයාණෝ දෙවියන් වහන්සේ සමඟ සිටි සේක: ධර්මයාණෝ දෙවියන් වහන්සේ ව ම සිටි සේක.

ආරම්භයේ දී උන් වහන්සේ, දෙවියන් වහන්සේ සමඟ සිටි සේක. සියල්ල උන් වහන්සේ කරණකොටගෙන මවන ලදි; උන් වහන්සේ නොමැති ව මවන ලද කිසිවක් නො වී ය. උන් වහන්සේ තුළ ජීවය විය; ඒ ජීවය මනුෂ්‍යයන්ගේ ආලෝකය විය. ආලෝකය අන්ධකාරයෙහි බබලයි: අන්ධකාරය කිසි කලෙක එය ග්‍රහණය නොකළේය.

(දෙවියන් වහන්සේ එවා වදාළ මනුෂ්‍යයෙක් වී ය. ඔහුගේ නම ජොහන් ය. ඔහු පැමිණියේ, තමා මඟින් සියළු දෙනා අදහා ගනු පිණිස ආලෝකය ගැන සාක්ෂි

දැරීමට, සාක්ෂිකරුවෙකු වශයෙනි. ඔහු ඒ ආලෝකය නොව, ඒ ආලෝකය ගැන සාක්ෂි දරණ පිණිස ආ තැනැත්තේ ය.)

සියළු මනුෂ්‍යයන් ආලෝකවත් කරවන සත්‍ය ආලෝකයාණෝ, ලොවට උදා වෙමින් සිටි සේක. උන් වහන්සේ ලෝකයෙහි සිටි සේක. ලෝකය ඇති වූයේ ද උන් වහන්සේ කරණකොට ගෙන ය. එහෙත්, ලෝකයා උන් වහන්සේ හඳුනා නොගත්හ. උන් වහන්සේ සිය දේශයට වැඩම කළ සේක, එහෙත්, ස්වකීය ජනතාව උන් වහන්සේ නොපිළිගත්හ. එසේ වුව ද උන් වහන්සේ පිළිගත් සියල්ලන්ට එනම්, උන් වහන්සේගේ නාමය අදහා ගත් අයට, දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස උපත ලැබීමේ වරම උන් වහන්සේ දෙවා වදාළ සේක. එසේ උපත ලැබුයේ, මානව සන්තතියෙන් වත්, කායික සබඳතාවෙන් වත්, මිනිස් පියෙකුගෙන් වත් නොව, දෙවියන් වහන්සේගෙන් ම ය.

ධර්මයාණෝ මාංසගත ව අප සමඟ වැඩ විසූ සේක. දේව වරප්‍රසාදයෙන්ද සත්‍යයෙන්ද පූර්ණ උන්වහන්සේගේ තේජශ්‍රීය, එනම්, පියාණන් වහන්සේ කෙරෙන් වූ එක ම පුත්‍රයාණන්ගේ තේජශ්‍රීය, අපි දුටිමු.

(ජොහන් උන් වහන්සේ ගැන සාක්ෂි දෙමින්, “මට පසුව එන තැනැත්වහන්සේ මට පෙර වූ බැවින්, මට වඩා උතුම් ය යි මා කීවේ මුන් වහන්සේ ගැනය”යි මොර ගසා කීය.

උන් වහන්සේගේ පූර්ණතාවෙන් අපි සියල්ලෝ ම වරප්‍රසාද පිට වරප්‍රසාද ලැබීමු. කුමක් හෙයින් ද, ව්‍යවස්ථාව මෝසෙස් මගින් දෙන ලද්දේ ය. එහෙත් දේව වරප්‍රසාදය හා සත්‍යය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් පැමිණියේ ය. කිසිවකු කවදාවත් දෙවියන් වහන්සේ දුටුවේ නැත. පියාණන්ගේ ළයෙහි වැඩවසන, උන් වහන්සේගේ එක ම පුත්‍රයාණෝ ම උන් වහන්සේ ප්‍රකාශ කර වදාළ සේක.)

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

(වරහන් අතර කොටස අත් හළ හැකිය.)